# මී මැසි ගෝචර ශාක හඳුනා ගනිමු

**බෝ**ග පරාගනය, මී පැණි, මී ඉටි, මී විෂ, රාජ ජෙලී වැනි වටිනා නිෂ්පාදන මෙන්ම සේවාවන් ද ලබා දෙන මී මැස්සන් ඔවුන්ගේ පැවැත්ම හා නිෂ්පාදන සඳහා මධු හා පරාග ලබා ගන්නා ශාක මී මැසි ගෝචර ශාක ලෙස හඳුන්වයි.

මල්වල පුමංගී කොටස් හෙවත් රේණුවල පවතින පිටි වැනි පරාග මී මැස්සාගේ ප්‍රෝටීන අවශ්‍යතාවය සඳහාත්, ජායාංග කොටස්වල ඇති මධුකෝෂ හා වෙනත් ස්ථානවලින් ස්‍රාවය වන සීනිමය ද්‍රාවණ හෙවත් මධු කාබෝහයිඩ්‍රේට් අවශ්‍යතාව සඳහාත් වැදගත් වේ. මෙසේ අවට ස්වභාවික පරිසරයේ පවතින ශාක විශේෂත්, වගා කරනු ලබන බෝග විශේෂත් බිඟුන්ගේ ආහාර සඳහා වැදගත් වන අතර ඒවායේ පවතින මධු හා පරාග ප්‍රමාණයන් අනුව ප්‍රධාන ගෝචර ශාක හා ගෝචර නොවන ශාක ලෙස අපට හඳුනා ගැනීමට හැකිය.

එසේම, මේවායින් මධු පමණක් ලබා දෙන ශාක විශේෂ ද, පරාග පමණක් ලබා දෙන ශාක විශේෂ ද, මධු හා පරාග යන දෙකම ලබා දෙන විශේෂයන් ද හඳුනාගත හැකිය. රෙඩ්ගම්, රබර්, බුරුත, සිට්‍රස් කුලයේ ශාක, අඹ, තල් වැනි ශාක බහුලව මධුත්, බඩඉරිඟු, සූරියකාන්ත, පොල්, වී, බ්‍රැකේරියා විශේෂ, වට්ටක්කා වැනි ශාක බහුලව පරාගත් ලබා දේ. පරිසරයේ හමුවන බොහෝමයක් ශාක මෙම දෙකම ලබා දෙයි.

මෙසේ මී මැස්සා ආහාර ගන්නා ගෝචර ශාක ඒවායේ ස්වරූපය අනුව ප්‍රධාන වශයෙන් පහත සඳහන් අයුරින් හඳුන්වා දිය හැකිය එනම්,

1. අඹ, කොත්තමල්ලි, එනසාල්, සාදික්කා, මාදුරු වැනි කුළු බඩු බෝග ද,
2. වී, කුරක්කන්, තල, කොල්ලු, බඩඉරිඟු, තණහාල්, මෙනේරි, මුං වැනි ධාන්‍ය බෝග ද,
3. කරවිල, පතෝල, වට්ටක්කා, බටු, මිරිස්, දඹල (කැරට්, රාබු හා සලාද බීජ නිෂ්පාදනයේ දී) වැනි එළවළු බෝගයන්ද,
4. නිදිකුම්බා, අස්වැන්න, බලුනගුට, ඇත්අඩි, පොඩිසිඤ්ඤෝමරං, හුලංතලා, උඳුපියලිය, තම්පලා, බ්‍රැකේරියා වැනි තෘණ වර්ග ඇතුළු පැළෑටි ශාකයන් ද,
5. අලිපේර, පැෂන්ෆෲට්, දෙඩම්, දෙහි, අඹ, කෙසෙල්, රඹුටන්, පෙයාස්, පීචස්, ජැම්, පේර, උගුරැස්ස, අනෝද වැනි පලතුරු ශාකයන් ද,
6. තෙල් එඬරු, සූරියකාන්ත, තල වැනි තෙල් බෝගයන් ද,
7. කලවැල්, බතල වැල්, වුඩ්රෝස්, බිංතඹුරු, දියහිඟුරු, එරමිණිය, වතුපාලු, පෙනෙල වැනි වැල් වර්ග ද,
8. නිවසේ අලංකාරය සඳහා වවන දහස්පෙතියා, අටපෙතියා, සීනියාස්, ඇන්ටිගනන්, මක්සඅයිඩේසි, ෆොගෙට් මී නොට්, රෝස, බෝගන්විලා, කුඩලු, ඩේලියා, කුපියා වැනි මල් වර්ගයන් ද
9. ඇකේෂියා, ඉයුකැලිප්ටස් රොබස්ටා (රෙඩ්ගම්) කැලිඇන්ඩ්‍රා, ටූනා, ලුණුමිදෙල්ල, මාර වගී, හල්මිල්ල, සපු, ඉපිල්-ඉපිල්, එරබදු වැනි වගා ශාකයන් ද
10. වියළි කලාපීය වනාන්තරවල ඇති අරළු, බුලු, නෙල්ලි, පලු, වීර, බුරුත, කෝන්, මී, ගල්සියඹලා, ගම්මාලු, සියඹලා, ඇටඹ, කුඹුක්, මාදන්, දඹ, කරඳ, මොර, සේරු, දවුල්කුරුඳු, කුරටිය, කොහොඹ, කහට, කර, දමිනි, කැප්පෙටියා, දිවුල්, බෙලි, කිරිකොන්, සැවැන්ඉදල, රුක්අත්තන වැනි ශාකයන් ද වශයෙනි.

කෘෂිකර්මාන්තයේ දී බෝග වගාවන්ගේ අස්වැන්න වැඩි කර ගැනීම සඳහා බලපාන පරාගනය සිදු වන ප්‍රධාන කාරකයන් වන සතුන් අතරින් ද ප්‍රධාන තැනක් මී මැස්සාට හිමි වේ. බෝග ස්ථාපිත ක්ෂේත්‍රයේ මී මැසි ජනපද නඩත්තුව මගින් සැලකිය යුතු ලෙස අස්වනු වැඩි කර ගැනීමට හැකි වේ.

පොල්, රඹුටන් හා එනසාල්වල 100% ද, කරවිල, කෝපි (බීජ) ධාන්‍යවල දී 80% - 90% පමණ ද, අබ, කොත්තමල්ලි, රාබු (බීජ), බෝංචි, තල වැනි බෝගවල 60% කට ඉහළ අස්වනු වැඩිවීමක් මී මැස්සන් මගින් පරාගනයෙන් සිදු

කර ගත හැක. මී මැස්සා ගෝචර ශාක මඟින් ලබා ගන්නා වූ මධු ප්‍රමාණය ද එම ශාකවල පිහිටි ස්ථාන ද ගෝචර ශාක අධ්‍යයනයේ දී වැදගත් වේ. ප්‍රධාන වශයෙන් මල්වල ඇති ඩිම්බ කෝෂ ආශ්‍රිත මධුකෝෂ පිහිටන අතර සමහර ශාකවල වෙනස් ස්ථානවල ද මේවා පිහිටයි. උදා:

1. රබර්, තෙල් එඬරු, කවුපි, අඬනහිරිය, ආදියේ නටුවෙන් ද,
2. දමින්න, තෙල් එඬරු වැනි ඒවායේ දල්ලෙන් ද,
3. පුවක්, පොල්, තල, කිතුල් වැනි ඒවායේ මුල් මඟින් ද,
4. උක් ගසේ කඳෙන් ද, කපු කොලයේ යට නාරටිය මඟින් ද,
5. ඉදුණු අඹ, වැල-වරකා, තල් ගෙඩි ලෙල්ල ආදියෙන් ද මධු වහනය වේ.

මෙලෙස මී මැස්සාගේ පැවැත්ම සඳහා අවශ්‍ය වන ගෝචර ශාක හඳුනා ගැනීමත්, ඒවා සංරක්ෂණයත් මී මැස්සා වෙනුවෙන් සිදු කළ හැකි මහඟු කාර්යයන් වේ.

**ඩබ්.පී.ආර්.එස්. කොස්ගොල්ල**
**කෘෂිකර්ම උපදේශක**
**මී මැසි සංවර්ධන ඒකකය - බිඳුණුවැව.**

---

**තීරණය**

අනේ මම දන්නෙ නෑ
ඉර – හඳට
දෙස් කියා පලක් නෑ ....
හැමදම
මෙහෙම ඉඳලත් වැඩක්
නෑ ....
මට සිතෙයි.
අම්මා,
හැමදමත් කියයි ....
පිංගුත්තරයෙක් වගේ
කකා හිටියාම
හරියා යෑ ....
ඇත්තමයි .....,
අප්පච්චි,
අම්බරුවෝ දක්කන අපුරුව,
අර ....
මගෙ වයසෙම උදවියත් එනනෙ .....
කැත්තේ – උදැල්ලෙ වැඩ,
අනේ හුරුව ......
පෙලවහක් කර ගන්නත්
මේ ඔක්කොම බලනවානෙ ...
ඔව් ...
මම දැන්ම බහිනව
මඩට ....
කෝ ..... මේ උදැල්ල ?

**සී.යූ. සේනානායක**

---

# කෙම් උගුල් සහ ශාන්ති කර්ම

## නියඟලා මල්

නියඟලා (*Gloriosa Superba*) මල් පිදෙන විට පොලොවෙහි පස තිත්ත වන බවට ගොවිහු විශ්වාස කරති. එබැවින්, මෙම කාලයේ දී පාරම්පරික ප්‍රවේශයක් තුළින් වී ගොවිතැන සිදු නො කෙරේ. ඔවුන් තවදුරටත් විශ්වාස කරන්නේ තිත්ත පස තුළ ක්ෂුද්‍ර ජීවීන්ගේ වැඩීමෙහි සමබරතාවය බිඳී යන බව සහ විශේෂයෙන්ම අහිතකර ක්ෂුද්‍ර ප්‍රාණීන්ගේ වර්ධනය වැඩි වී එහි ජනගහනය ඉහළ යන බවකි. නියඟලා මල් පිපීම තුළින් මෙය විදහා දක්වන බව ඔවුනගේ විශ්වාසයයි.

- පොත පත ඇසුරෙනි -